PAFFREL

# 2023 අගෝස්තු මස
# දේශපාලන විශ්ලේෂණය

## විධායක සාරාංශය

පසුගිය වසරේදී ආරම්භ වූ ආර්ථික බිඳවැටීම හේතුවෙන් ජනතාවට අත්විඳීමට සිදුව තිබෙන ආර්ථික දුෂ්කරතා හට මෙම සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ඇති වූ දේශපාලන කතිකාවන්ගේ ප්‍රමුඛස්ථානය හිමිවිය. සුබදායි වෙනසක් ඇති කරලීමේ බලපොරුත්තුව, දක්ෂ වෘත්තිකයින් විදෙස් ගත වීමෙන් වළක්වාලීමට තරම් ප්‍රමාණවත් නොවීය. අගෝස්තු මාසයේදී මලය දමිළ ජනතාව මෙරටට සංක්‍රමණය වී වසර 200ක් පිරීම එම ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කරන සිවිල් සමාජ සංවිධානවල ඒකාබද්ධ ප්‍රයත්නයෙන් යුතුව අනුස්මරණය කරනු දක්නට ලැබිණි. වර්තමාන ආර්ථික අර්බුදය දරුණු ලෙස බලපා ඇත්තේ ජනගහණයෙන් 50%ක් තරම් ප්‍රතිශතයක දරිද්‍රතා මට්ටමක සිටින වතුකරයේ සේවය කරන ජනතාව හටයි (මෙය දළ ජාතික සාමාන්‍යට වඩා දෙගුණයකි) . පළාත් පාලන ආයතන සඳහා සියයට 25ක තරුණ කෝටාවක් ලබාදීමට රජය කල්පනා කරමින් සිටින බවට ජනාධිපති ලේකම් කාර්යාල වෙබ් පිටුවේ ප්‍රදර්ශනය කිරීම සහ ඒ බව දක්වමින් රජයේ මන්ත්‍රීවරයකු විසින් සිදු කළ ප්‍රකාශයක් ජාතික මාධ්‍ය අවකාශ හරහා ප්‍රචාරණය කිරීම හැර මැතිවරණ සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් සිදු නොවීය. ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් කරන ලද ප්‍රකාශයන් සම්බන්ධයෙන් ද සැලකිය යුතු ප්‍රචාරණයක් ලබා දී තිබූ නමුත් ඒ හරහා බිම්මට්ටමේ සැලකිය යුතු කිසිදු වෙනසක් පිළිබිඹු කිරීමට සමත් නොවීය. කෙසේ වුවද බලය බෙදීමේ සැලැස්ම විවෘත හෝ විනිවිදභාවයෙන් වියුක්ත වුවකි.පොලිස් බලතල රහිතව 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කළ හැකි බවට වූ ජනාධිපතිවරයාගේ යෝජනාව කිසිදු දේශපාලන පක්ෂයක හෝ සිවිල් සමාජ සංවිධානයක ස්ථාවරය නොවීය. ජනාධිපතිවරයාගේ යෝජනා තවදුරටත් ක්ෂණික හෝ කෙටි කාලීන ජයග්‍රහණ පොරොන්දු නොව "ජාතික සමගිය සහ ප්‍රතිසන්ධාන කොමිසම" නමින් සත්‍ය සෙවීමේ කොමිසමක් පත් කිරීම වැනි මධ්‍ය කාලීන සිට දිගු කාලීන ජයග්‍රහණ දක්වා සැලසුම් සකස් කිරීම කෙරෙහි අවධානය යොමු වී ඇත. අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය, තොරතුරු දැනගැනීමේ අයිතිය, විසම්මුතිය ප්‍රකාශ කිරීමේ අයිතිය, විරෝධය දැක්වීමේ අයිතිය, සාමූහිකව රැස්වීමේ අයිතිය, ඡන්ද අයිතිය වැනි අයිතීන්ට එරෙහිව එල්ල වී ඇති තර්ජන හේතුවෙන් මෙරට ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ගිලීයාම රට තුළ අඛණ්ඩ පිරිහීමට හේතු වී ඇති හෙයින් එකී ව්‍යවස්ථානුකූලව සහතික කර ඇති අයිතිවාසිකම් සහ නිදහස සමග රට තුළ ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය වේගයෙන් හැකිලී යාමට එරෙහිව අනතුරු ඇඟවීම සඳහා 500ක් ඉක්මවූ සිවිල් සමාජ සාමූහිකත්වයක් "ප්‍රජාතන්ත්‍රවාදය සඳහා නැගී සිටීම" යන සටන් පාඨය යටතේ එක් රැස්විය.

මැතිවරණ

ජනාධිපතිවරයාගේ විශ්වාසවන්තයෙකු ලෙස සැලකෙන පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමනාත් සී. දොළවත්ත මහතා පළාත් පාලන ආයතන තුළ 25%ක තරුණ නියෝජනයක් අනිවාර්ය කිරීම සඳහා පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන බවට ප්‍රතිඥා දුන්නේය. මෙම සන්ධිස්ථානීය යෝජනාව ආණ්ඩුකරණය සඳහා තරුණ පුරවැසියන්ගේ අදහස් ලබා ගැනීම සහ පරම්පරා අතර අන්තර්කරණය කිරීම පෝෂණය කිරීමේ උවමනාව අවධාරණය කරයි. පළාත් පාලන මැතිවරණ පනතට 1990 අංක 25 දරණ සංශෝධනය මගින් හඳුන්වා දුන් තරුණ කෝටාව හරහා වයස අවුරුදු 18-35ත් අතර තරුණ අපේක්ෂකයින්ගෙන් 40%ක් සඳහා නාම යෝජනා

ලැයිස්තුවේ අවස්ථාව හිමි විය. හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා විසින් 1990දී පත් කරන ලද තරුණ කොමිසමේ නිර්දේශ මත රජය විසින් මෙම තරුණ කෝටාව ලබා දීමට තීරණය කෙරිණි. එය පිහිටුවන ලද්දේ ජවිපෙ කැරැල්ලෙන් පසුව කැරැල්ලට පාදක වූ හේතු විමසා බැලීමටය.මෙම 40% කෝටාව 1991, 1997, 2002, 2006 සහ 2011 දී මැතිවරණවලදී අනිවාර්ය විය. ඉන්පසු 2012 අංක 22 දරණ පළාත් පාලන සංශෝධන පනත මගින් එකී 40%ක කෝටා ප්‍රතිශතය 25% දක්වා අඩු කරන ලදී. 2017 ජූනි මාසයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ මැතිවරණ සංශෝධන පනත් කෙටුම්පතට සියයට 30 ක අනිවාර්ය තරුණ කෝටාව ඇතුළත් විය. නමුත් අවාසනාවන්ත ලෙස අගෝස්තු මස 25 වන දින මෙම පනත පාර්ලිමේන්තුවේ සම්මත වන අවස්ථාවේ එකී වගන්තිය ඉවත් කර තිබුණි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් එල්ල වූ සෘණාත්මක අදහස් හේතුවෙන් එකී වගන්තිය ඉවත් කොට තිබිණි. ඔවුන් පෙන්වා දී තිබුණේ මෙම අනිවාර්ය කෝටාව හේතුවෙන් නාමයෝජනා ලැයිස්තු ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බවයි. ඒ අනුව තරුණ කෝටාව වෙනුවට පනත හරහා හඳුන්වා දී තිබු 25%ක කාන්තා කෝටාව බලාත්මකව ක්‍රියාත්මක විය. පාර්ලිමේන්තු මන්ත්‍රී දොලවත්තගේ මෙම ප්‍රකාශය මාධ්‍ය තුළ පුළුල් ප්‍රචාරයක් ලබා ගත් අතර එය ඉදිරියට ගෙන යමින් ජනාධිපති මාධ්‍ය අංශය විසින් රජය විසින් මැතිවරණ කල්දැමුවද එය ඉහළම දේශපාලන ස්ථරයේ සහය ලබමින් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියට සහ මැතිවරණ සඳහා සැබවින්ම කැපවී සිටින බව ජනතාවට ඒත්තු ගැන්වීමට යෝජනා කරමින් සිටියි.

## ආර්ථිකය

අගෝස්තු මාසයේදී එළිදැක්වූ එක්සත් ජාතීන්ගේ අධ්‍යනයක් පෙන්වා දුන්නේ මෙරට එකතැන පල්වෙන ආර්ථික තත්ත්වයක් පවතින බවයි. අතිමහත් බහුතරයකගේ ජීවන තත්ත්වය දිගින් දිගටම පිරිහෙමින් පවතී. යුනිසෙෆ් අධ්‍යයනයක් පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකාවේ 3 ශ්‍රේණියේ ළමුන්ගෙන් සියයට 85 ක් සාක්ෂරතාවය සහ ගණන් කිරීම පිළිබඳව අවම ප්‍රවීණතාවයක් ලබා ගැනීමට අසමත් බවයි. යුනිසෙෆ් ආයතනය තවදුරටත් සඳහන් කර ඇත්තේ දකුණු ආසියානු රටවල් අතරින් අධ්‍යාපන වියදම් දැරීම අතින් පහළම ස්ථානයේ සිටින්නේ ශ්‍රී ලංකාව බවයි. මෙරට එම අගය සියයට 2 ක් පමණක් වන අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් අධ්‍යාපනය සඳහා වෙන් කළ යුතු වන සියයට 4-6 ජාත්‍යන්තර මිණුම් ලකුණට වඩා බෙහෙවින් අඩු අගයක් බවයි.

පසුගිය වසරේදී ආරම්භ වූ ආර්ථික බිඳවැටීම හේතුවෙන් ජනතාවට අත්විඳීමට සිදුව තිබෙන ආර්ථික දුෂ්කරතා හට මෙම සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ඇති වූ දේශපාලන කතිකාවන්ගේ ප්‍රමුඛස්ථානය හිමිවිය. සුබදායි වෙනසක් ඇති කරලීමේ බලපොරොත්තුව දක්ෂ වෘත්තිකයින් විදෙස් ගත වීමෙන් වළක්වාලීමට තරම් ප්‍රමාණවත් නොවීය. වෛද්‍ය වෘත්තිකයින් විශේෂයෙන්ම විශේෂඥ වෛද්‍යවරුන් අහිමි වීම මෙරට මාධ්‍ය හරහා දැඩි කතාබහට ලක් විය. ඔවුන්ගේ හිඟය ජනතාවට ඇතැම් වෛද්‍ය සේවාවන් ලබා ගැනීමට ප්‍රවේශ වීම සඳහා දැඩි දුෂ්කරතා ඇති කරලීමට හේතු විය.

තොරතුරු තාක්ෂණ (IT) විශේෂඥයින් අහිමි වීම හේතුවෙන් එම සමාගම්වලට ජාත්‍යන්තර වෙළඳපොළේ සේවා අවස්ථාවන් සැපයීමට තරම් හැකියාවක් නොමැති වීම නිසාවෙන් මෙම ඉහළ ආදායම් අංශයේ ව්‍යාප්තිය සීමා වී තිබේ. පසුගිය මාස නවය තුළ පමණක් ගුරුවරුන් 5,000 ක් පමණ රට හැර ගොස් ඇති අතර මෙරටින් සංක්‍රමණය වන බහුතරයක් අය අතර ඉංග්‍රීසි, ගණිතය සහ තොරතුරු තාක්ෂණ ගුරුවරු ද වෙති.

මෙම සංක්‍රමණයන් තනි පුද්ගලයින් පමණක් නොව සමාගම් වශයෙන්ද සිදුවෙමින් පවතී. ඇතැම් ප්‍රමුඛ සමාගම් විදේශයන්හි සංස්ථාපනය කිරීමත් සමඟ මෙරට ඇඟලුම් ක්ෂේත්‍රය හට ඔවුන්ගේ තරඟකාරී රටවල්වල වෙළඳපොල කොටස් අහිමි වීමේ තර්ජනයට මුහුණ පා සිටියි. "වැං කර්මාන්ත ආයතනය, ඒකාබද්ධ ඇඟලුම් සංගම් සංසදය (JAAF) පැවසුවේ, "සංඛ්‍යාවලින් පෙනී යන ආකාරයට, ඉහළ ස්ථාවරත්ව හැකියාවක් පවතින අංශයන්ට මෙකී තත්ත්වය හිතකර නොවන බවයි." 2023 ජනවාරි-ජූලි කාලසීමාව සඳහා ඇඟලුම් අපනයනයෙන් ඉපැයීම බිලියන 2.68ක් වූ අතර එය පෙර වසරට වඩා 18.94% කින් පහළ ගොස් ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනට අදාලව ශ්‍රී ලංකාවේ නිරීක්ෂණය කළ හැකි කාර්ය සාධන (Commitments) 100 පිළිබඳව ප්‍රගතිය මැනීම සඳහා වන දත්ත නොමැති වීම මාර්තු මස සිට ජූලි මස වනට

විට එය 9% සිට 15% දක්වා ඉහළ ගොස් ඇත. ඩැරසළුඩ් ඝැිට්රජය ආයතනයට අනුව මෙම කාර්ය සාධන පිළිබඳව සාධාරණ තක්සේරුවක් කිරීමට තොරතුරු නොමැතිකම, විශේෂඥයින්ගේ අදහස් යනාදිය ඡළුහ වැඩසටහන සම්බන්ධයෙන් රජයේ ප්‍රගතිය පිළිබඳ දෘශ්‍යමාන සාධකයන්ගේ ඌනතාවය වර්ධනය වීම ඉස්මතු කරලීමට හේතු වී ඇත. ඩැරසළුඩ් ඝැිට්රජය පෙන්වා දෙන්නේ ජයග්‍රහණය "නොදන්නා" වන කැපවීම් සංඛ්‍යාව ඉහළ යාමෙන් කරුණු දෙකක් හෝ ඒවායින් එකක් අදහස් විය හැකි බවයි. පළමුවැන්න නම් , රජය මෙම පොරොන්දු ඉටු කිරීමට අපොහොසත් වී ඇති අතර අසාර්ථකත්වය හඳුනා ගැනීම ප්‍රමාද කිරීමට තොරතුරු ප්‍රසිද්ධ නොකිරීමයි. දෙවැන්න රජය මහජනතාව හෝ පාර්ලිමේන්තුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී වැදගත් පාර්ශවකරුවන් ලෙස නොදකින අතර ඔවුන්ට තීරණාත්මක තොරතුරු සැපයීමට උනන්දුවක් නොදක්වනවා යන්නයි.

# නීතිය

මලය දමිල ජනතාව නියෝජනය කරන සිවිල් සමාජ සංවිධානවල ඒකාබද්ධ ප්‍රයත්නයෙන් යුතුව මලය ජනතාව ශ්‍රී ලංකාවට පැමිණ වසර 200ක් පිරීම සැමරීම සිදු විය. පවතින ආර්ථික අර්බුදය වඩාත් උග්‍ර ලෙස බලපා ඇත්තේ වතුකරයේ වැඩ කරන ජනතාවටයි. දිනකට රුපියල් 1000 ක සොච්චම් වැටුපක් සඳහා ඔවුන්ගේ අරගලය ආරම්භ වූයේ 2015 දී කොවිඩ් වසංගතය ජාතික ආර්ථිකය දුර්වල කිරීමට පෙර සිටය. වතුකරයේ පවුලක වැඩකරන්නන් සංඛ්‍යාව කුමක් වුවත් අද වන විට රුපියල් 1000 ක වැටුපෙන් ජීවත් වීමට නොහැකි බව පැහැදිලිය. ලෝක බැංකු සමීක්ෂණ වාර්තා හෙළිකරන්නේ සමස්ත ජනගහනයේ දරිද්‍රතාවයෙන් 50%ක් සිටින්නේ මෙම වතුකරයේ පීඩිත ජනතාව බවයි. මෙම අවාසනාවන්ත තත්ත්වය තුළ ඔවුන්ගෙන් කිහිප දෙනෙකු පා ගමනට සම්බන්ධ වීම සඳහා තම රැකියාවෙන් නිවාඩු ලබාගෙන අවම දින ගණනක් වැඩ කිරීමට අවශ්‍ය දිනකට රුපියල් 1000 ක් අත්හැරීම පුදුමයක් නොවේ. සති දෙකක් පුරා පැවති මෙම පාගමනේදී සංකේතාත්මකව වතුකරයේ ජනතාව නියෝජනය කළ බොහෝ දෙනා ජාතික සිවිල් සංවිධානවලින් පැමිණි අයයි. ජාතික ක්‍රිස්තියානි සභාව සහ සිවිල් සංවිධාන කිහිපයක් එක්ව පිහිටවූ "මාන්බුමිහු මලයහ මක්කල්" නමින් ක්‍රියාත්මක වූ සාමූහිකත්වය මෙම ව්‍යාපෘතියට සහයෝගය දැක්විය.

"වතුකරයේ පදිංචිකරුවන් ලෙස 500,000 කට අධික පිරිසක් ඇතුළු මලයහ දෙමළ ප්‍රජාවගේ වර්තමාන තත්ත්වය, ස්වේච්ඡා නොවන සංක්‍රමණය වීමේ ඉතිහාසයක ප්‍රතිඵලයක් වී ඇති බවත්, මෙය ප්‍රජාවගේ සමාජ-ආර්ථික යහපැවැත්ම කෙරෙහි බලපා ඇත. වැඩිම බලපෑමක් එල්ල වී ඇත්තේ වතුකරයේ ජීවත්වන සහ වැඩ කරන පිරිසටයි. ඔවුන් රටේ අනෙකුත් සෑම ප්‍රජාවකටම සාපේක්ෂව මානව සංවර්ධන දර්ශක සියල්ලෙහිම පාහේ පහළ තත්ත්වයන් අත් කරගනිමින් රටේ වඩාත්ම ආන්තික කණ්ඩායම බවට පත්ව ඇත. මෙය ඔවුන්ගේ වතු හාම්පුතුන් හා බැඳුනු හා ඔවුන් මත යැපෙන කම්කරුවන්ගේ සිට අන් අයට සමාන අයිතිවාසිකම් ඇති ශ්‍රී ලංකාවේ පූර්ණ පුරවැසියන් දක්වා සංක්‍රමණය වීම බරපතල ලෙස අඩාල කිරීමට හේතු වී ඇති බවත්" එම සාමුහිකය විසින් නිකුත් කර ඇති නිවේදනයේ සඳහන් වේ.

බලය බෙදීම

අගෝස්තු මාසයේදී රජය බලය බෙදීම සහ ඒ ඔස්සේ පැන නගින ගැටලු පිළිබඳව සැලකිය යුතු අවධානයක් යොමු කළේය. මෙම ආණ්ඩුකරණ ක්ෂේත්‍රය පිළිබඳව නායකත්වය ගනිමින් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් පසුගිය වසර පහක් හෝ ඊට වැඩි කාලයක් නිද්‍රාශීලීව පැවති මෙම ක්‍රියාවලිය සම්බන්ධ සාකච්ඡාවට නායකත්වය දෙන ලදී. මෙකී වර්තමාන දේශපාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය වනාහි අනෙකුත් දේශපාලන සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගෙන් වියුක්තව අඩු උපදේශනයක් සහිතව ජනාධිපතිවරයා විසින් මෙහෙයවනු ලබන පටු ක්‍රියාවලියකි. විශේෂයෙන්ම මෑත කාලයේ වඩාත් ප්‍රමුඛත්වයට පත් වූ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය සහ බලතල බෙදීම සම්බන්ධයෙන් වූ කාරණා සඳහා මෙම තත්ත්වය බලපා තිබේ. ජනාධිපතිවරයා විසින් තමන් බලයට පත් වී කෙටි කලකින් ජාතික සංහිඳියාවට ප්‍රමුඛත්වය දෙන බවට ඉඟි ලබා දුන්නේය. ජනාධිපතිවරයා සංහිඳියාවට ප්‍රමුඛත්වය දීම සම්බන්ධයෙන් පොරොන්දු වූ ආකාරය අනුව ඔහු සිටි සන්දර්භය තුළ ඔහු දේශපාලන වශයෙන් උපායමාර්ගිකව සිටි බවට අනුමාන කළ හැක.

කෙසේ වෙතත්, බලය බෙදීමේ සැලැස්මේ සංවර්ධන ක්‍රියාවලිය විවෘත හෝ විනිවිදභාවයෙන් බැහැර වුවකි. 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කළ හැකි නමුත් පොලිස් බලතල ක්‍රියාත්මක කළ නොහැකි ය යන මතය කිසිදු දේශපාලන පක්ෂයක් හෝ සිවිල් සමාජ සංවිධානයක් විසින් ගන්නා ස්ථාවරයක්

නොවීය. එය ජනාධිපතිවරයාගේම මතය සහ ඔහු වටා සිටින ඔහුගේ කණ්ඩායම් සාමාජිකයන්ගේ මතය බව පෙනේ. ඒ හා සමානව, අන්තර්වාර ලේකම් කාර්යාලයක අද්විතීය ව්‍යුහය සහිත සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය දේශපාලන පක්ෂ, වින්දිතයින්ගේ කණ්ඩායම් හෝ මානව හිමිකම් නිරීක්ෂණ සංවිධාන හෝ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ අන්තර්ග්‍රහණයෙන් හෝ විනිවිදභාවයෙන් යුතුව කරන ලද සාකච්ඡාවක ප්‍රතිඵලයක් නොවේ. මෙම තත්ත්වය තුළ රජය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සලකා බැලිය යුත්තේ යෝජනා ලෙස මිස නීතියක් බවට පත් කළ යුතු අවසාන එකඟතාවයන් ලෙස නොවේ. ඒවා සාකච්ඡා කිරීමට, එකඟවීම් ඇති කරගැනීමට සහ සංශෝධනය කිරීමට සිදුවනු ඇත.

## ජාතික සංහිඳියාව

ජනාධිපතිවරයා විසින් ජාතික සංහිඳියාව පිළිබඳව සිදු කරන යෝජනා ක්ෂණික හෝ කෙටිකාලින ජයග්‍රහණවලින් බැහැරව මාධ්‍ය කාලින සහ දිගු කාලින පොරොන්දු වෙත සිය පැහැදිලි අවධානය යොමු කොට ඇත. මෙය ජනාධිපතිවරයා විසින් මීළඟ මැතිවරණයෙන් පසු ඔහුගේ සැලසුම් වඩා යහපත් වනු ඇති බවට වන බලපොරොත්තු ජනිත කරවන්නකි. 13 වැනි සංශෝධනය සම්බන්ධයෙන් ඔහු පසුගියදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ගැඹුරු සහ පුළුල් තත්ත්වය වාර්තාවේ (position paper)නීතියේ ඇති සංකීර්ණතා ගැඹුරින් සොයා බැලිය. මෙම සංකීර්ණතා සැලකිල්ලට ගනිමින්, ඒවා ලිහාගනිමින් දෙමළ දේශපාලන පක්ෂ සමඟ එකඟතාවකට පැමිණීමට අවම වශයෙන් වසරක කාලයක්වත් ගතවනු ඇත.

ජාත්‍යන්තර ප්‍රජාවෙන් සහ මානව හිමිකම් සංවිධානවලින් එල්ල වන බලපෑම්වලට ප්‍රතිචාර වශයෙන් රජය ඉදිරිපත් කර ඇති යෝජිත සත්‍ය සහ ප්‍රතිසන්ධාන යාන්ත්‍රණයට ද මෙම තර්කයම අදාළ වේ. ජාතික සමගිය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව (NURC) සම්බන්ධයෙන් රජය විසින් කෙටුම්පත් කර ඇති සවිස්තරාත්මක ව්‍යවස්ථාව රජය විසින් ඒකපාර්ශ්විකව සම්මත කරන ලද නීතියක් ලෙස සලකන්නේ නම් එහි වටිනාකම අඩු වනු ඇත. හඹඝක පිහිටුවීමේ ව්‍යවස්ථාව සුළු ජාතික පක්ෂවල එකඟතාවයෙන් යුක්තව පාර්ලිමේන්තුවේ බහුතරය විසින් සම්මත කරන ලද්දක් වේනම් එය වඩා අගය කිරීමට භාජනය වනු ඇත. දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවගේ පිළිගැනීම නියෝජනය වන එම දේශපාලන පක්ෂවල කැමැත්තද හඹඝක නීතියක් බවට පත් වීමට අවශ්‍ය වේ. නමුත් වර්තමානයේ පෙනෙන්නට තිබෙන කරුණනම් මෙම මේ සම්බන්ධයෙන් ස්ථිර යාන්ත්‍රණයක් සකස් කරන තුරු වසරක පමණ කාලයක් ක්‍රියාත්මක වීමට බලාපොරොත්තු වන සත්‍ය සෙවීමේ කොමිසම පිහිටුවීමේ නීති කෙටුම්පතට හෝ අන්තර්වාර ලේකම් කාර්යාලයක් පිටුවීමට වෙත දෙමළ හා මුස්ලිම් පක්ෂ කැමැත්ත ලබා දීමක් සිදුව නොමැති බවයි.

## සිවිල් සමාජය

ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා ඒකරාශී වූ 500කට අධික සිවිල් සමාජ සන්ධානය විසින් සැබෑ සහ සාධාරණ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සහතික කරමින් සඳහා ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සුරකින ලෙසටත්, රාජ්‍ය මර්ධනය නවතා දමන ලෙසටත් සඳහා දේශපාලන නායකත්වයෙන් ඉල්ලා සිටියේය. එහිදී රජය විසින් සිදු කරනු ලබන විරුද්ධ මත මර්දනය කිරීමත් එමගින් ජනතාව මුහුණ පා සිටින දැඩි දුෂ්කරතා හේතුවෙන් රට මුහුණ පා ඇති පරිහානිගත තත්ත්වය පිළිබඳව ඔවුන් සාකච්ඡා කළහ. " රාජ්‍ය මර්දනය තවදුරටත් ක්‍රියාත්මක කරමින් මර්දනකාරී නීති ස්වරූපයන් ලෙස හඳුන්වා දුන් ප්‍රති ත්‍රස්ත පනත, විකාශන නියාමන කොමිෂන් සභා පනත, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ පනත ආදිය රජය විසින් ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයන් බිය වැද්දීමට සහ පාලනය කිරීමට දරණ ප්‍රයත්නයන්ට නිදසුන් බවට එම සාකච්ඡාවේදී මතු වූ අදහස වඩා ඉස්මතු විය.

**මෙම සිවිල් සමාජ සාමුහිකය පහත දැක්වෙන යෝජනා ක්‍රියාත්මක කරමින් ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික මූලධර්ම ආරක්ෂා කිරීමට සහ ආරක්ෂා කිරීමට කඩිනම් පියවර ගන්නා ලෙස දේශපාලන අධිකරින්ගෙන් ඉල්ලා සිටියේය.**

- පළාත් පාලන හා පළාත් සභා මැතිවරණයෙන් වහාම පවත්වමින් සියලු දෙනාම ඇතුලත් වූ නිදහස් හා සාධාරණ මැතිවරණ නියමිත වේලාවට පැවැත්වීම සහතික කිරීම.

- අදහස් ප්‍රකාශ කිරීමේ සහ  සමාගමයේ නිදහස සහ තොරතුරු දැනගැනීමේ අයිතිය ඇතුළුව පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

- සිවිල් අවකාශය ආරක්ෂා කිරීම සහ සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.

- ආර්ථික යථා භාවයට මෙහෙයවීම සඳහා පුරවැසියන්ගේ අදහස් ලබා ගැනීම  සහ සහභාගීත්වය සහතික කිරීම.

- පූර්ණ මහජන පරීක්ෂාව සහතික කරමින් විනිවිදභාවයෙන් සහ වගවීමෙන් පාලනය කිරීම.

- ස්වාධීන කොමිෂන් සභාවලට තම කාර්ය භාරයන් ඵලදායී ලෙස ඉටු කිරීමට බල ගැන්වීම.

- අත්‍යාවශ්‍ය දූෂණ විරෝධී ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අවංක උත්සාහයක් ගන්න.

- අපරාධකරුවන්ට දණ්ඩමුක්තියේ අවස්ථාව ලැබීම  අවසන් කිරීම සඳහා අතීත සහ වර්තමාන දූෂණ ක්‍රියා සම්බන්ධයෙන් නඩු පැවරීමට කටයුතු කිරීම.

ප්‍රකාශනයේ නිදහස, තොරතුරු දැනගැනීමේ අයිතිය, විසම්මුතිය ප්‍රකාශ කිරීමේ අයිතිය, විරෝධතා දැක්වීමේ අයිතිය, සංගමයේ නිදහස  සහ ඡන්ද බලය උදුරා ගැනීම හරහා බොහෝ විට පුරවැසියන් බල රහිත කරලීම වැනි ව්‍යවස්ථානුකූලව සහතික කර ඇති අයිතිවාසිකම් සහ නිදහස උදුරාගනිමින් රට තුළ පවතින ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය සීඝ්‍රයෙන් හැකිලීයාම  පිළිබඳව ද සාමූහිකය සිය කනස්සල්ල පළ කළේය. " හඬ නැගීම නතර කරලීම සඳහා බලධාරීන්ගෙන් ප්‍රශ්න කරන පුද්ගලයන් ඉලක්ක කරමින් හිරිහැර සහ ස්වයං වාරණයට පොළඹවන ආකාරයේ සීතල මර්දනයක් ක්‍රියාත්මක වේ."

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම්  කවුන්සිලය ඇතුළු ජාත්‍යන්තර  සම්මුතීන්ට  පටහැනිව දේශපාලන විරුද්ධවාදීන්, සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ මාධ්‍යවේදීන් ඉලක්ක කර ගැනීම සඳහා පාලකයො  සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය සහ මතභේදාත්මක ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත අනිසි ලෙස භාවිතා කරමින් සිටිති. ප්‍රති ත්‍රස්ත පනත,  විකාශන නියාමන කොමිෂන් සභා පනත සහ රාජ්‍ය නොවන සංවිධාන පනත වැනි නීතිවල අතිශය පීඩාකාර ස්වරූපයන් හඳුන්වා දීම ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයන් පාලනය කිරීම සඳහා මෑතකාලීනව රජය ගෙන ගිය  මර්දන ප්‍රයත්නයන්ට නිදසුන් වේ. එසේම මෑතකාලීනව ජනාධිපතිවරයා, පාර්ලිමේන්තුවේ කථානායකවරයා සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු විසින් සිදු කළ  ප්‍රකාශයන් අධිකරණයේ ස්වාධීනත්වය හැල්ලුවට ලක්කිරීමට ගත උත්සාහයන් ලෙස පෙන්වා දිය හැක.

**PAFFREL**

**16**, Byrde Place, Off Pamankada Rd, Colombo 06, Sri Lanka.

**TEL**: el: 011 2 558 570/1   Fax: 011 2 558 572
**FAX**: 11 2 558 572

**Email**: paffrel@sltnet.lk

www.paffrel.lk